Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2017

බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බද්ධකරු III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය ඇති ස්ත්‍රී/ පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. 1.1 *මාසික වැටුප් පරිමාණය* : මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව PL2 - 2016 වන අතර,
රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 වේ.
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන II ප්‍රකාරව වැටුප් ගෙවනු ලැබේ).

1.2 *දීමනා* : රජය විසින් අනුමත ජීවන වියදම් දීමනා වැටුපට අමතරව ගෙවනු ලැබේ.

2. *වයස් සීමාව* : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2017.11.17 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අයදුම්කරුවන් හට මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය. පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන දිනට උපරිම වයස් සීමාව ඉක්මවා නොතිබිය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

3. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්* :

| *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|
| බද්ධකරු | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාග යේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතු ය. (එකවර විෂයයන් පහක් (05) සමත් වී තිබීම අනිවාර්ය වේ.) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයක හෝ වෙනත් පිළිගත් ආයතනයක පැළ බද්ධ කිරීම මගින් ශාක ප්‍රචාරණය පිළිබඳ අවම වශයෙන් මාස 06ක පුහුණුවක් ලබා තිබිය යුතු අතර, ඒ බව සහතිකයකින් සනාථ කළ යුතු ය. (2017.11.17 දිනට පෙර වලංගු සහතිකයක් විය යුතු ය.) |

4. *අනෙකුත් සුදුසුකම්* :

*(අ)* අයදුම්කරු, ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
*(ආ)* මනා චරිතයකින් යුක්ත විය යුතු ය.
*(ඇ)* මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
*(ඈ)* 2017.11.17 දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය තිබිය යුතු ය.

5. *කායික සුදුසුකම්.-* සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාත තුළ සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

6. *සේවා කොන්දේසි.-* මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතු ය.)

අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

තෝරාගනු ලබන අයදුම්කරුවන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

7. *බඳවා ගැනීමේ ක්‍රමය.-* සුදුසුකම්ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

8. *තනතුරෙහි කාර්යයන්.-* කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයන්හි කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය මූලික පහසුකම් සම්පාදනය සඳහා ඒවාට අයත් පැළ තවාන් ඒකක පුළුල්ව පවත්වාගෙන යාමට අවශ්‍ය පරිදි බද්ධ ක්‍රම මගින් අවශ්‍ය ශාක ප්‍රචාරණය සිදුකිරීම හා ඊට අදළ නඩත්තු කටයුතු.

9. *අයදුම් කිරීමේ ක්‍රමය.-* මෙම *ගැසට්* නිවේදනය සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව, ඒ4 ප්‍රමාණයේ (සෙ. මී. 21x23) කඩදසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.11.17 දින හෝ එදිනට පෙර "ලේකම්, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.), තැ.පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බද්ධකරු තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම - 2017" යනුවෙන් සඳහන් කළ යුතු ය. ප්‍රමාදවී හෝ නියමිත සුදුසුකම් සපුරා නොමැතිව හෝ අසම්පූර්ණව ඉදිරිපත් කරන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත් ලැබුණු බවට දැනුම් දෙනු නොලැබේ.

මෙම නිවේදනයට අනුව, අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවකදී ඔවුන් විසින් අවශ්‍ය සුදුසුකම් සපරා නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ ඇතුළත් කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වෙතොත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එන්. නිල්වල,
ලේකම්,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා
සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය (බ.ප.).

තැ. පෙ. 566, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික (අර්ධ ශිල්පීය) සේවා ගණයේ බද්ධකරු තනතුර සඳහා බඳවා ගැනීම - 2017**

01. *(අ)* මුලකුරු සමග නම :...............................................................................................................

*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :....................................................................................

..................................................................................................................................

*(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................

02. ස්ථිර ලිපිනය :...............................................................................................................

03. රාජකාරි ලිපිනය :...............................................................................................................

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :...............................................................................

05. *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................................

*(ආ)* දුරකථන අංකය : පෞද්ගලික :............................................... රාජකාරී :.............................................

06. *(අ)* උපන් දිනය : වර්ෂය :................................, මාසය :................................, දිනය :................................

*(ආ)* 2017.11.17 දිනට වයස : අවු. :................................, මාස :................................, දින :................................

(සම්මුඛ පරීක්ෂණයේ දී උප්පැන්න සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුය.)

07. *අධ්‍යාපන සුදුසුකම් :*

(සහතික මගින් සනාථ කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.)

අ.පො.ස. (සා.පෙළ) විභාගය :

විභාගයට පෙනී සිටි වර්ෂය :................................ විභාග අංකය :................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| 1. .................................................................. | .......................................... |
| 2. .................................................................. | .......................................... |
| 3. .................................................................. | .......................................... |
| 4. .................................................................. | .......................................... |
| 5. .................................................................. | .......................................... |
| 6. .................................................................. | .......................................... |
| 7. .................................................................. | .......................................... |
| 8. .................................................................. | .......................................... |

08. *වෘත්තීය සුදුසුකම් :*

පුහුණුව ලබාගත් ආයතනය :..................................................................................................................................................................

පුහුණු කාල සීමාව :..................................................................................

සහතිකය වලංගු වන දිනය :............................................................................................................................................

(සහතික මගින් සනාථ කළ යුතු ය. සම්මුඛ පරීක්ෂණයේ දී සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුතු ය)

09. *පළපුරුද්ද :*

*(අ)* සේවය කළ/ කරන ආයතනයේ නම :.....................................................................................
*(ආ)* සේවා කාලය :.....................................................................................
(ලිපි මගින් සනාථ කළ යුතු ය.)

10. .............................................................වන මා විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති කිසියම් හෝ තොරතුරක් සාවද්‍ය යැයි මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මෙම තනතුර සඳහා මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසුව වරද අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම හොඳාකාරවම දනිමි. තවද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.............................................

11. *දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

................................................................................................................ මහතා/ මිය/ මෙනවිය .................................................වැනි දින සිට .................................................................... ආයතනයේ ............................................................ වශයෙන් සේවය කරන බවත්, පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර වෙනත් විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවත්, සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, පූර්වාසන්න වසර 02 තුළ වැටුප් රහිත නිවාඩු ලබා නොමැති බවත් සඳහන් කරමි.

දිනය :..........................................

.........................................................................................

ආයතන ප්‍රධානියාගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.